දිනමිණ සිළුමිණ
The Silumina
epaper

# ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව

## අධ්‍යාපන අමාත්‍යාංශය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව, දේශයේ රාජ්‍ය අංශ විද්‍යාඥයින්ට මූල්‍යමය සහාය ලබා දෙන, 2016 අංක 11 පනතින් ස්ථාපිත, අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන රජයේ අරමුදල් ලබන නියෝජිතායතනයකි.

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර අධ්‍යක්ෂ (මුදල් හා පරිපාලන) - MM1-1- තනතුරු 01 යි.

**රැකියා විස්තරය :** ගිණුම්කරණ ක්‍රියාකාරකම්, මූල්‍යමය දත්ත සහ සාමාන්‍ය පරිපාලනය සඳහා වගවීම.

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ශ්‍රී ලංකා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ගිණුම්කරණය, වාණිජ්‍යය, කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක්

**හෝ**

2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයකින් මෙම තනතුරට අදාළ විෂය පරාසයේ අන්තර් මධ්‍ය විභාගය සමත්වීම.

**සහ**

රජයේ ආයතනයක / හෝ මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක ගිණුම්කරණය / විගණනය පිළිබඳ අවම වශයෙන් වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය පරාසයේ කනිෂ්ඨ කළමනාකාර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :**

MM1-1-2016[රු. 53,175/= - 10X1,375/= - 15X1,910/= - 95,575]

**සියලුම තනතුරුවලට අදාළ වෙනත් කොන්දේසි :**

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
2. තනතුරේ රාජකාරි මැනැවින් ඉටුකරලීම සඳහා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය.
4. බඳවා ගැනීම ලිඛිත තරගකාරි විභාගයක් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.
5. පත්වීමේ ස්වභාවය, සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) හිමිකාරිත්වය සහිත ස්ථිර පත්වීමකි.
6. අයදුම්කරුවන් තම අත්සන යෙදූ අයදුම්පත්, උප්පැන්න සහතිකයේ පිටපත, අදාළ අනෙකුත් සහතික සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනකුගේ නම් හා ලිපිනයන් සමග ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කොට 2024 පෙබරවාරි 27 වැනිදා හෝ ඊට පෙර, "**කොළඹ 07, විද්‍යා මාවත, 120/7, ජාතික පර්යේෂණ සභාවේ, සභාපති**" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.
7. රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් ඔහු / ඇය තෝරා ගනු ලැබුවහොත් මුදවා හැරිය හැකි බවට කැමැත්ත පළකරන අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
8. ඉහත අවශ්‍යතාවයන් හා අනුකූල නොවන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙන අතර, සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ අභිමතික බලය ජාතික පර්යේෂණ සභාව සතුවේ. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

මෙම දැන්වීම ජාතික පර්යේෂණ සභාවේ www.nrc.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත.

**සභාපති,**
**ජාතික පර්යේෂණ සභාව,**
**120/7, විද්‍යා මාවත,**
**කොළඹ 07.**

**දුරකථනය : 011-2675176 ෆැක්ස් : 0112675136**